## II කොටස

- මෙම කොටස අනු කොටස් තුනකින් සමන්විත ය.
- "අ" කොටසින් ප්‍රශ්න දෙකක් හා "ආ" සහ "ඉ" කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
- I කොටස හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාරදෙන්න.

---

### "අ" කොටස
### සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව

01. "ක්‍රිස්තු වර්ෂ 5 වන සියවසේ සිට හෝ ඊටත් පෙර සිට ශ්‍රී ලංකාව තුළ විශිෂ්ට සිතුවම් සම්ප්‍රදායක් තිබුණු බවට හමුවී ඇති සිතුවම් කිහිපය සාක්ෂි දරයි."

I. අනුරාධපුර යුගයෙන් හමු වූ බෞද්ධ සිතුවම් සහිත ස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. "සීගිරි සිතුවම් ලොවට කියාපාන්නේ හෙළ චිත්‍ර ශිල්පියාගේ ප්‍රතිභාවයි." සීගිරි සිතුවම්වල වස්තු විෂය, ශිල්ප ක්‍රම පිළිබඳව කෙටි විමසීමක් කරන්න. (ලකුණු05)

III. "අනුරාධපුර යුගයේ සිතුවම් අතර සීගිරි සිතුවම්වලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි." සීගිරි සිතුවම් අතර ඇති කාන්තා රූපවල දක්නට ලැබෙන විශේෂතා සහ වෙනස්කම් පිළිබඳව විස්තර කරන්න. (ලකුණු08)

02. "ශ්‍රී ලාංකේය විහාර සිතුවම් කලාවේ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කළ ශිල්පීන් දෙදෙනෙකු ලෙස එම්. සාර්ලිස් සහ සෝලියස් මෙන්දිස් හැඳින්විය හැකිය."

I. එම්. සාර්ලිස් ශිල්පියා විසින් සිතුවම් කරන ලද විහාර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. සෝලියස් මෙන්දිස් ශිල්පියා විසින් කැලණිය නව විහාරයේ චිත්‍රකරණය සඳහා තෝරාගත් තේමා නිරූපණය කර ඇති අයුරු කෙටියෙන් පහදන්න. (ලකුණු05)

III. එම්.සාර්ලිස් සහ සෝලියස් මෙන්දිස් ශිල්පීන්ගේ සිතුවම් ශෛලීන්හි කැපී පෙනෙන වෙනස්කම් පිළිබඳව විග්‍රහයක් කරන්න. (ලකුණු08)

03. "ලාංකේය බුදුපිළිම කලාව අතර හමුවන භාවාත්මක බුදුපිළිම නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ අනුරාධපුර ප්‍රතිමා ශිල්පීන්ට ය."

I. අනුරාධපුර යුගයෙන් හමු වන හිඳි බුද්ධ ප්‍රතිමා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. අනුරාධපුර පන්කුලිය බුද්ධ ප්‍රතිමාව පිළිබඳව කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 05)

III. "අනුරාධපුර යුගයේ බුද්ධ ප්‍රතිමා සඳහා භාවිත කර ඇති මාධ්‍ය, ශිල්ප ක්‍රම සහ කලාත්මක ලක්ෂණ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු08)

## "ආ" කොටස
## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - ඉන්දියාව

04. "ක්‍රිස්තු වර්ෂ 01 වන සියවසේ සාන්ධාර ප්‍රදේශයේ ඇරැඹි බුදුපිළිම කලාව ක්‍රිස්තු වර්ෂ 04 වැනි සහ 05 වැනි සියවස වන විට ඉතා උසස් තත්ත්වයකට පත් විය."

I. සාන්ධාර ප්‍රදේශයේ නිර්මාණය වූ බුදු පිළිමවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් නම් **කරන්න.** (ලකුණු 02)

II. ක්‍රිස්තු වර්ෂ 01 වෙනි සියවසේ දී කුෂාණයන් විසින් බුදුපිළිම නිර්මාණය ඇරඹීමට හේතු පාදක වූ කරුණු සැකෙවින් පහදන්න. (ලකුණු05)

III. "සාන්ධාරයට සමකාලීනව ඇරඹී මථුරා ගුරුකුලය තුළ නිර්මාණය වූ බුදුපිළිම ගුප්ත යුගය වන විට ඉතා ප්‍රශස්ත මට්ටමකට පැමිණ ඇත." පහදන්න. (ලකුණු08)

05. "ඉන්දු නිම්න ශිෂ්ටාචාරය භාරතය තුළ දැකගත හැකි පැරණිම ශිෂ්ටාචාරයකි."

I. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ මුද්‍රා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ ලෝකඩ නළඟන රූපය ගැන කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු05)

III. "පැරණි මානවයා තුළ මූර්ති නිර්මාණය කෙරෙහි තිබූ පරිණත දැනුම පිළිබඳව ඉන්දු නිම්න ශිෂ්ටාචාරය සාක්ෂිදරයි." උදාහරණ තුනක් ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න . (ලකුණු08)

## "ඉ" කොටස
## සංස්කෘතික පසුබිම හා රසාස්වාදය - යුරෝපය

06. "වසර දහස් ගණනක් පැරණි සංස්කෘතීන් අතරින් මිසර ශිෂ්ටාචාරයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි."

I. මිසර ශිෂ්ටාචාරය තුළ හමුවන දේවස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ඔබ නම් කරන ලද දේවස්ථාන අතුරින් එක් දේවස්ථානයක් පිළිබඳව විස්තරයක් කරන්න. (ලකුණු05)

III. මිසර සිතුවම් අතර හමුවන "නාටිකාංගනාවෝ සහ සංගීතඥයෝ" සිතුවම සහ "කුරුළු දඩයම" සිතුවම පිළිබඳව සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු08)

07. "යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ලෙන් සිතුවම් ක්‍රිස්තු පූර්ව 40000 - 10000 අතර කාල වකවානුවට අයත් වේ."

I. යුරෝපීය ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් නිර්මාණය කර ඇති ශිල්ප ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ප්‍රංශයේ ලැස්කෝ ගුහාවේ ඇති ප්‍රාග් ඓතිහාසික සිතුවම් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු05)

III. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් සහ ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම්වල විශේෂතා පිළිබඳව සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු08)